# ගුරු සිසු සබඳතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම

කනත්තේගොඩ සද්ධාරතන හිමි
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධශ්‍රාවක විශ්ව විද්‍යාලය

අධ්‍යාපන පරමාර්ථ සාධනය කර ගැනීමෙහිලා අර්ථවත් ගරු සිසු සබඳතාවක් පැවතීම අතිශය වැදගත් සාධකයකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි අත්‍යන්තයෙන් ම සම්බන්ධ වන දෙපිරිස ගුරුවරු සහ ශිෂ්‍යයෝය. එම කාර්යය සාර්ථක ව හා සමාජයට ඵලදායී ලෙස සිදුවීමට නම් ගුරු සිසු දෙපක්ෂය අතර අන්‍යොන්‍ය අවබෝධය හා විශ්වාසය මත ඇති කරගත් සබඳතාවක් පැවතිය යුතුය. ඒ සඳහා දෙපක්ෂය අතරින් සම්පූර්ණ විය යුතු යුතුකම් සමුදායකි. බෞද්ධ අධ්‍යාපන දර්ශනය තරම් ගුරු සිසු සම්බන්ධය ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කළ වෙනත් අධ්‍යාපන දර්ශනයක් නොමැති තරම්ය. ගරුවරයා සතු කාර්යය. ගුරු ආචාර ධර්ම ගුරුවරයාගේ හා ශිෂ්‍යාගේ අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් ගුරු ශිෂ්‍ය ආකල්ප ආදිය පිළිබඳ විවරණ අතිශයින් ම අර්ථවත්ය. බෞද්ධ අධ්‍යාපනය ගිහි පැවිදි වශයෙන් දෙපාර්ශවයකට අදාළ ක්‍රියාමාර්ගයන්ගෙන් සමන්විත වේ. විශේෂයෙන් බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ මූලික පරමාර්ථය වනුයේ සමාජයට හිතකාමී වූත් ආචාරශීලි වූත් අර්ථසම්පන්න මිනිස් සමාජයක් ගොඩනැගීමය. මේ සඳහා වූ බෞද්ධ ඉගැන්වීම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් මෙමගින් සිදු කෙරේ

මුල් බුදු සමයෙහි බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතම ගුරුවරයකු ලෙස හඳුන්වා ඇත. ඒ සඳහා යොදා ගනු ලැබූ නාමයන් කිපයකි. ඒ අතර "සත්ථා" යන වචනය බහුල වශයෙන් යෙදී ඇත. එම වචනයෙන් ශාස්තෘවරයා හෙවත් ගරුවරයා යන අර්ථය මතු කරයි. දෙව් මිනිසුන් ඇතුළු සියලු සත්වයන්ට ශාස්තෘ හෙවත් ගුරු වූ බැවින් "සත්ථා දේව මනුස්සානං"[1] යනු නව අරහාදි බුදු ගුණයන්ගෙන් එකකි. ගුරුවරයා විවිධ කුසලතාවන්ගෙන් පරිපූර්ණ වූවෙකු විය යුතුය. දැනුමෙන් පරිපූර්ණ නිර්මාණ කුසලතාවන්ගෙන් පරිපූර්ණ සිසු මනස හා සිසු අවශ්‍යතා මෙන් ම රුචි අරුචිකම් හැඳිනගෙන ක්‍රියා කිරීමේ දක්ෂතාවන්ගෙන් පරිපූර්ණ විය යුතුය. මෙම සියලු ගුණාංගයන්ගෙන් පරිපූර්ණ ගුරුවරයකු ලෙස බුදුන් වහන්සේ ගෞරව ලබති. 'තවද බුදුන් වහන්සේ හැඳින්වීම සඳහා "අක්ඛාතාරෝ" යන්න භාවිත කොට ඇත. අක්ඛාතාරෝ යන්නෙන් ගැඹුරු සංකල්ප පවා මැනවින් අර්ථකථනය කිරීමෙහි කුසලතාව ඇති තැනැත්තා යන අර්ථය වේ. එසේ ම එම වචනයෙන් කථිකයා, දේශකයා, කථා කියන්නා යන අදහස් නිරූපණය වේ. එපමණක් ද නොව කෙටියෙන් ප්‍රකාශ කරන යමක් විස්තර වශයෙන් ප්‍රකාශ කරන්නා යන අදහස් ද කියවේ. තව ද බෞද්ධ ඉගැන්වීම් අනුව ගුරුවරයා ශිෂ්‍යයා හික්මවිය යුතු ය. පුද්ගලයන් මනාව හික්මවන පුද්ගලයෙකි. ඒ බව පුරිස දම්ම සාරථී බුදුගුණයෙන් ද අර්ථවත් වෙයි කිසිවෙකුට සමකළ නො හැකි ප්‍රජානන (විජ්ජා) ආවේදන(චරණ) මනෝචාලක (කෝසල්ල) යන කුසලතාවන්ගෙන් පරිපූර්ණ ගුරුවරයා යන අදහස එම ගුණයෙන් මතු වෙයි. අංගුත්තර නිකාය කේසී සූත්‍රයෙන් පුරිස දම්ම සාරථී ගුණය අර්ථවත් වෙයි. අශ්වයන් දමනය කරන පුද්ගලයා අශ්වයන් දමනය කරන ආකාරය එම සූත්‍රයෙන් පැහැදිලි වෙයි. එසේ ම බුදුන් වහන්සේ ද ස්වකීය ශ්‍රාවක පිරිස හික්මවන ආකාරය එහි දී පැහැදිලි කළ සේක. මේ අනුව මෙලොව

පහළ වූ ශ්‍රේෂ්ඨතම ගුරුවරයා වූ ලොව්තුරු බුදුරදුන් හැඳින්වීම සඳහා සත්ථා, අක්ඛාතාරො, පුරිස දම්ම සාරථී ආදි වචන ව්‍යවහාර කර ඇති බව පැහැදිලිය. බෞද්ධ අර්ථ කථනය අනුව ගුරුවරයා හැඳින්වීම සඳහා ගුරු [5]යන වචනය භාවිත කර ඇත. ගුරු යන්නෙහි අදහස ගම්භීර යන්නයි. බෞද්ධ ඉගැන්වීම අනුව ප්‍රජානන, ආවේදන හා මනෝචාලක යන ත්‍රිවිධ ශක්‍යතාවන්ගෙන් පරිපූර්ණ වූ යන අදහස ගුරු යන්නෙන් ගම්‍ය වේ. එසේ ම ගුරුවරයා යන සංකල්පය අර්ථවත් කිරීම සඳහා බුදු සමයෙහි තවත් ප්‍රකට වචන දෙකක් භාවිත කොට ඇත. එනම් ආචරිය හා උපජ්ඣාය[6] යන පද දෙකයි. මෙහි ආචරිය යනු ගුරුවරයා ය. උපජ්ඣාය යනු ආධ්‍යාත්මික ශික්ෂණය ලබා දෙන ගුරුවරයාය. ශිෂ්‍යයා උපජ්ඣායන් වහන්සේ සමීපයෙහි ම සිටිමින් හික්මිය යුතුය. මෙය විශේෂ වශයෙන් ම අදාළ වන්නේ පැවිදි ශිෂ්‍යයන් සඳහා ය.

වර්තමාන පැවිදි සමාජයේ මෙන් ම ගිහි සමාජයේ ද ගුරු සිසු සබඳතාව ක්‍රමයෙන් හීනවෙමින් පවතින බව පෙනේ. එබැවින් ම මේ පිළිබඳ අවධානය යොමු කිරීම කාලෝචිතය. ගුරුවරයා යනු සමාජයේ ගෞරවණීය, සම්භාවණීය පුද්ගලයෙකි. ඔහු ආදර්ශ සම්පන්න චර්යාවන්ගෙන් යුතු පුද්ගලයකු විය යුතුය. ගුරුවරයකු තුළ පැවතිය යුතු සුදුසුකම් සමුදායක් පිළිබඳ බුදු සමය පැහැදිලි කරයි. මහා වග්ගපාළි මහා ඛන්ධකයෙහි සඳහන්වන එම කරුණු සාරාංශ කරමින් මෙසේ දැක්විය හැකි ය.

* ගුරුවරයා ශිෂ්‍යයාට සංග්‍රහ කරන්නෙකු විය යුතුය. (සංග්‍රහ), *ගුරුවරයා ශිෂ්‍යයාට උපකාර කරන්නෙකු විය යුතුය. (අනුග්ගහ). *ගුරුවරයා උගන්වන්නෙකු විය යුතු ය (උද්දේස). *ගුරුවරයා ශිෂ්‍යයන්ගෙන් කරුණු විමසන්නෙකු විය යුතු ය. (පරිපුච්ඡා). *ගුරුවරයා ශිෂ්‍යයාට අවවාද කරන්නෙකු විය යුතු ය. (ඕවාද). *ගුරුවරයා ශිෂ්‍යයාට අනුසාසනා කරන්නෙකු විය යුතුය (අනුසාසනා) යනුවෙනි.

මෙම කරුණු මූලික වශයෙන් පැවිදි සමාජය මුල් කොටගෙන කරන ලද අනුසාසනා වුව ද ගිහි පැවිදි උභය සමාජයෙහි ම සදාචාරය අර්ථවත්වීම සඳහා පැවතිය යුතු උපදේශයෝ වෙති. එසේ ම මිලින්ද ප්‍රශ්නයේ දී යහපත් ගුරුවරයෙකුගේ ලක්ෂණ සමුදායක් දක්වා ඇත. ඒවා වර්තමාන ගුරුවරුන්ට සිය වගකීම් හැඳිනගෙන චර්යාවන් යහපත් කර ගැනීම සඳහා කදිම මඟ පෙන්වීමක් ලෙස පෙන්වා දිය හැකි ය.

* යහපත් චරයා කෙරෙහි ලජ්ජා ඇත්තෙකුවීම (ලජ්ජී). * ප්‍රියශීලි ඇවතුම් පැවතුම් ඇත්තෙකුවීම (පේසලො). * සිල්වත්වීම (සීලවා). යහපත ගති ඇත්තෙකු වීම (කලයාණ ධම්මො). * බොහෝ ඇසූපිරූ තැන ඇත්තෙකුවීම (බහුස්සුතො). * ධර්මය පිළිබඳ දැනුම ඇත්තෙකුවීම (ධම්මධරො). * ප්‍රසන්න පුද්ගලයෙකුවීම (පියො). * ගරු බුහුමන් ලැබීමට සුදුස්සෙකුවීම (ගරුභාවනියො), * යමක් කියාදීමේ දී දක්ෂයකු වීම (වත්තා). * වචන ඉවසන සුළු පුද්ගලයෙකු වීම (වචනක්ඛමො). * අවවාද දෙන්නෙකු වීම (ඔවාදකො). * කරුණු අවබෝධ කරන්නෙකු වීම (විඤ්ඤාපකො). * කරුණු ගෙනහැර දක්වන්නෙකු වීම (සංදස්සකො). * කරුණු පිළිගැන්වීම කරන්නෙකු වීම (සමාදපෙතා). * පොළඹවන්නෙකු වීම (සමුත්තෙජකො). * පහදවාගන්නෙකු වීම (සංපහංසකො)[7]

මිලින්ද ප්‍රශ්නයේ සඳහන් වන මෙම කරුණු අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ශිෂ්‍යයාට ඉගැන්වීම පමණක් ගුරුවරයාගේ කාර්යය නො වන බවයි. ගුරු යන වචනයෙන් ඊට වඩා පළල් ගැඹුරු අර්ථයක් නියෝජනය කරන බව තහවුරු වේ. ඒ අනුව ගුරුවරයා පළමුව ආදර්ශ සම්පන්න පුද්ගලයෙකු විය යුතු බව මෙමගින් කියවේ. අනතුරුව ශිෂ්‍යයා